# බ්‍රිතානි මහාකොමසාරිස්ගේ පත්තර වන්දනාව

මෙරට සිටින බටහිර තානාපතිවරුන්ගෙන් ඇතැමකුට හා ඇතැම් ඉන්දියානු මහාකොමසාරිස්වරුන්ට ලංකාව යනු තවත් ස්වෛරී රාජ්‍යයක් නො වෙයි. ඩික්සිත් වැන්නන්ට ලංකාව ඉන්දියානු සාගරයේ, එනම් ඉන්දියාවේ සාගරයේ, පිහිටි කුඩා රටක් විය. ඔවුන්ට අවශ්‍ය වුයේ මෙරට ඉන්දියාවේ යටත්විජිතයක් හෝ ඉන්දියාවට අයත් කොටසක් ලෙස හෝ පවත්වාගෙන යෑමට ය. ඇතැම් බ්‍රිතානි මහාකොමසාරිස්වරුන්ට ලංකාව තවමත් බ්‍රිතානි අධිරාජ්‍යයට යටත් රටකි. ඔවුන් සිතන්නේ තමන් තවමත් මෙරට ආණ්ඩුකාරවරුන් බව ය. නෝර්වේ තානාපති යනු මේ සෙල්ලමේ අතිරේක ක්‍රීඩකයකු පමණක් වෙයි. අපට වැඩිපුර ඇසෙන්නට ලැබෙන්නේ ඔහුගේ වතුර ඇදීම් වැනි ක්‍රියාකාරකම් ගැන නමුත් නෝර්වේ ක්‍රියාකරන්නේ බටහිර ප්‍රධාන රටවල, විශේෂයෙන් ම බ්‍රිතානියේ අවශ්‍යතා පරිදි ය.

මෙරට බ්‍රිතානි මහාකොමසාරිස්වරයාට හදිසියේ ඩේලි මිරර් පුවත්පතේ කතුවරිය බැහැදැකීමට අවශ්‍ය වී ඇත. එයට හේතුව ඇය හා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහතා අතර ඇතිවිණි යැයි කියන දුරකථන කතාබහකි. ඒ දුරකථන සංවාදයෙහි දී ආරක්ෂක ලේකම්වරයා කතුවරියට තර්ජනය කර ඇතැයි කියැවෙයි. මහාකොමසාරිස්වරයා කතුවරිය බැහැදැක ඇත්තේ බ්‍රිතානිය ඩේලි මිරර් පුවත්පත සමග සිටින බව කීමට ය. වෙනත් වචනවලින් කියන්නේ නම් ලංකාණ්ඩුව හා ඩේලි මිරර් පුවත්පත අතර ප්‍රශ්නයෙහි දී (එවැනි ප්‍රශ්නයක් ඇත්නම්) බ්‍රිතානිය ඩේලි මිරර් පුවත් පතේ පැත්ත ගන්නා බව ය. බ්‍රිතානි මහාකොමස්රිස්වරයා යනු මෙරට බ්‍රිතානිය නියෝජනය කරන පුද්ගලයා නිසා අපට එලෙස අර්ථකථනයකිරීමට සිදුවෙයි.

ලංකාණ්ඩුව කළයුතුව තිබුණේ වහාම බ්‍රිතානි මහාකොමසාරිස්වරයා නිගරු පුද්ගලයකු කර රටින් බැහැරකිරීම ය. කලකට පෙර මෙරට ඡන්ද කටයුතු ගැන අනවශ්‍ය උනන්දුවක් දැක්වූ බ්‍රිතානි මහාකොමසාරිස්වරයකු සම්බන්ධයෙන් එවකට ජනාධිපති වූ ප්‍රේමදාස මහතා කටයුතු කෙළේ ඒ ආකාරයට ය. මහින්ද රාජපක්ෂ මහතා ඇතැම් කරුණුවලදී ප්‍රේමදාස මහතා අනුගමනයකරන බව පැහැදිලි ය. යම් යම් කරුණු සම්බන්ධයෙන් ප්‍රේමදාස මහතා අනුගමනය නොකළ යුතු නමුත් පුවත්පත් කතුවරියන් හමුවීමට යන මහාකොමසාරිස් සම්බන්ධයෙන් නම් මහින්ද රාජපක්ෂ මහතා ක්‍රියාකළ යුතුව තිබුණේ ප්‍රේමදාස මහතා ක්‍රියාකළ ආකාරයෙනි. මහාකොමසාරිස්වරයා සිතා සිටින්නේ තමන් මෙරට බ්‍රිතානි ආණ්ඩුකාරයා ලෙස බව පෙනෙයි.

බ්‍රිතානියේ, එසේත් නැත්නම් එක්සත් රාජධානියෙහි (මේ විවිධ නම් එංගලන්තයේ යටත්විජිත ලෙස වේල්සය, උතුරු අයර්ලන්තය හා ස්කොට්ලන්තය පවත්වාගෙන යන බව සැඟවීම සඳහා යොදාගන්නා වචන පමණක් වෙයි) පුවත්පත්කතුවරුන් හමු වී එරට ශ්‍රී ලංකා මහාකොමසාරිස්වරිය ඇතැම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් තමන් රජය සමග නොව පුවත්පත සමග යැයි ප්‍රකාශකළහොත් උද්ගතවන තත්වය කුමක් ද? ලන්ඩනයේ පුවත්පත් කාර්යාල පවත්වාගෙන යන ෆ්ලීට් වීදිය ඇයට තහනම් ප්‍රදේශයක් විය හැකි ද? එසේත් නැත්නම් ඇය එරට නිගරු පුද්ගලයකු බවට පත්වේ ද?

අපේ රටේ ප්‍රශ්නය වී ඇත්තේ අප ඇතැමකු තවමත් එංගලන්තය හා බටහිර රටවල් හෝ ඉන්දියාව හෝ සම්බන්ධයෙන් දීන මානසිකත්වයක් දැරීම ය. ලෝකයේ ක්‍රියාත්මක වන සංස්කෘතික ආධිපත්‍යය පිළිබඳ බොහෝදෙනාට, විශේෂයෙන් උගතුන් යැයි කියාගන්නා අයට, කිසිම අවබෝධයක් නැත. තමන් ප්‍රබුද්ධ යැයි සිතන තරුණ පිරිසකට දැනුම් ආධිපත්‍යය පිළිබඳ මෙලෝ හසරක දැනුමක් නැත. ඔවුන්ගෙන් ඇතැමකු සිතන්නේ චිත්‍රපටිවලට ඊනියා ජාත්‍යන්තර තෑගි ලැබෙන්නේ ඒ චිත්‍රපටිවල කැමරාකෝණ, නළු නිළියන් හසුරුවා ඇති ආකාරය සිනමාරූපිබව ආදිය සලකා බලා කියා ය. මොවුන් සමහරකුට තමන්ගේ අදහසක් ප්‍රසිද්ධියේ කියාපෑමට තරම්වත් ආත්මශක්තියක් නැත. රුෂ්ඩිගේ නවකතාවලට සම්මාන ලැබෙන්නේ එහි ආකෘතිය නිසා යැයි ඔවුහු විශ්වාසකරති. එහෙත් ඊනියා ජාත්‍යන්තර තෑගි ලැබෙන බොහෝ කලාකෘතිවල ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සරිලන එයට අනුගත වූ අන්තර්ගතයකි. එසේත් නැත්නම් කලාපීය වශයෙන් නම් භාරතීය වෛදික බමුණන් සතුටු කරන බෞද්ධ විරෝධී කතාවස්තු ය. බටහිරයෝ ඒ සියල්ල වසාගැනීම සඳහා බොරු ප්‍රවාද ඉදිරිපත්කරති. ඒ අතර ආකෘතිය පිළිබඳ කියන මනස්ගාත ද වෙයි. මෙරට බොරු ප්‍රබුද්ධයෝ දැනුම් ආධිපත්‍යයට යටවී මේ බොරු ප්‍රවාද

© Prof. Nalin De Silva

පුනරුච්චාරණය කරමින් තම බොල් බව හා ගැතිබව ප්‍රකාශකරති. කලාකෘතියකට පිටරටක දී තෑග්ගක් ලැබුණහොත් ඒ ගැන සියවරක් සිතා බැලිය යුතු ය.

මේ ඊනියා ප්‍රබුද්ධයෝ, එනම් මැට්ටෝ හා පුස්සෝ, මානව අයිතිවාසිකම් ගැන ද කතාකරති. බොහෝ විට ඔවුන් කරන්නේ එක්කෝ වෙනත් කවුරුන් හෝ සිංහලෙන් කියා ඇති දෙයක් නැවත කීම ය. එසේත් නැත්නම් ඉංගිරිසියෙන් ඇති මතයක් තමන්ට තේරෙන ආකාරයට සිංහලෙන් ප්‍රකාශකිරීම ය. වෙනත් කවුරුන් හෝ කර ඇත්තේ ද ඉංගිරිසියෙන් හෝ ඇතැම්විට ප්‍රංශ හෝ වෙනත් යුරෝපීය බසකින් හෝ ඇති දෙයක් තමන්ට තේරෙන ආකාරයට සිංහලෙන් කීම ය. කෙසේ වෙතත් මොවුන්ට පුරුදුකර ඇත්තේ මානව අයිතිවාසිකම් යනු වාස්තවික වූවක් ලෙස සැලකීමට ය. බටහිරයන් දැනුම සම්බන්ධයෙන් නොකියන ප්‍රධානම කාරණය ඒ සංස්කෘතියට, ඉන්ද්‍රිය පද්ධතියට හා මනසට සාපේක්ෂ බව ය.

එංගලන්තයේ ඊනියා මානව අයිතිවාසිකම් සැමදා එකලෙස පැවතුණු දෑ නො වේ. එහි විකාශයක් ඇත. අද එංගලන්තයේ හා වෙනත් බටහිර රටවල ඇත්තේ ඒ රටවල් ස්වෛරී රාජ්‍ය ලෙස තහවුරුවීමෙන් පසුව නිර්මාණය කරගත් අයිතිවාසිකම් පද්ධතියකි. මෙයට අවුරුදු තුන්සීයකට නොව අවුරුදු පණහකට පෙර ද පැවතියේ වෙනත් මානව අයිතිවාසිකම් ය. රාජ්‍යයක් බලවත් වෙත්ම, එනම් එහි විධායකය, ව්‍යවස්ථාදායකය, අධිකරණය, හමුදාව, පරිපාලන ක්‍රමවේද ශක්තිමත්වෙත්ම එයට දියහැකි ඊනියා මානව අයිතිවාසිකම් ද වැඩිවෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි මානව අයිතිවාසිකම් නම් සංකල්පය පැනනැංගේ රාජ්‍යය හා පුද්ගලයා අතර වූ නිදහස පිළිබඳ සටනේ ප්‍රතිඵලයක් ලෙස ය. මෙහි ඇති සරදම නම් පුද්ගලයන්ට එම ජාතියෙහි ඊනියා මානව අයිතිවාසිකම් වැඩි වැඩියෙන් දීමට රාජ්‍යයකට හැකිවන්නේ ඒ රාජ්‍යය බලවත් වූ තරමට වීම ය. ඒ බලය ඇතැම්විට දේශපාලන විය හැකි ය. ඇතැම්විටක ඒ ආර්ථික විය හැකි ය. තවත් සමරවිටක ඒ සංස්කෘතික වෙයි. බටහිර දේශපාලන විද්‍යාඥයන් අනාගමික හෙවත් ඓහිය රාජ්‍ය පිළිබඳ මොන බේගල් දෙසා බෑව ද, අද ඒ රටවල් සංස්කෘතික වශයෙන් ක්‍රිස්තියානි රටවල් වෙයි. එංගලන්තයේ පන්සලක් ස්ථාපිතකිරීම ලංකාවේ පල්ලියක් කෝවිලක් පටන්ගැනීම වැනි සුළු කාර්යයක් නොවන බව එහි ගොස් සිටින සිංහල බෞද්ධයෝ දනිති. බටහිර ගණිතය හා බටහිර භෞතික විද්‍යාව සංස්කෘතික වශයෙන් යුදෙව් ක්‍රිස්තියානි වූ කල බටහිර දේශපාලන විද්‍යාව ගැන කතාකිරීමෙන් වැඩක් නැත. ඒ අමු අමුවේ ම යුදෙව් ක්‍රිස්තියානි වෙයි. බටහිරයෝ තම දැනුම් ආධිපත්‍යය පදනම් කරගනිමින් එහු දේශපාලන විද්‍යාවක් යොදාගනිමින් ඊනියා අනාගමික රාජ්‍ය පිළිබඳ බයිලා කියති. බටහිර සමාජ විද්‍යාඥයෝ, නීතිඥයෝ බටහිර ද නැති බටහිර ක්‍රිස්තියානි මානව අයිතිවාසිකම් රැකීමට අපට බලකරති. එහෙත් එංගලන්තය අද පවා අයිරිෂ් ජාතිකයන්ට දී ඇති නිදහස කුමක් ද? බර්නාඩ් ෂෝ, ඔස්කා වයිල්ඩ් ආදීහු අයිරිෂ් ජාතිකයෝ වූහ. ඉංගිරිසින් ඔවුන් ලවා ඉංගිරිසියෙන් පමණක් පොත් ලියවාගැනීමෙහි ම ඇත්තේ සංස්කෘතික ආධිපත්‍යයකි. ඒ අධිපතිවාදී සියුම් බලකිරීම බටහිරයන්ගේ දැනුම් ආධිපත්‍යය පිළිගත් නිසාම මෙරට විශ්වවිද්‍යාලවල, පුවත්පත්වල හා වෙනත් ආයතනවල ඊනියා ජනමාධ්‍යවේදීන් කලාවිචාරකයන් ආදීන් බවට පත්ව ඇති ව්‍යාජ ප්‍රබුද්ධයන්ට නො තේරෙයි. එහෙත් මෙරට දෙමළ ලේඛකයකුට සිංහලෙන් පමණක් ලිවීමට සිදුවිණි නම් ලිප්ටන් වටරවුමට වටරවුම් අයිතිවාසිකම් නොලැබෙනු ඇත.

බ්‍රිතානියේ 1889, 1911, 1989 රාජ්‍ය රහස් පිළිබඳ පණත් මගින් රාජ්‍යයේ ආරක්ෂාව සඳහා රහස් ලෙස තිබිය යුතු තොරතුරු සංනිවේදනයකිරීම නීති විරෝධි කෙරී ඇත. සියල්ලට ම පළමුව ඇත්තේ රාජ්‍ය ආරක්ෂාව ය. රාජ්‍යය ආරක්ෂිත නම් ඇතැම් පෞද්ගලික නිදහස් පුද්ගලයන්ට ලැබෙයි. එහෙත් ලංකාවේ එසේ නො වේ. මෙරට පුවත්පත් වත්මන් අර්ථයෙන් ආරම්භකළෝ බ්‍රිතානීහු ය. ඔවුන් මෙරට ඊනියා ජනමාධ්‍යවේදීන් පුහුණු කර ඇත්තේ බ්‍රිතානි රාජ්‍යය රැකීමට මිස ලංකා රාජ්‍යය රැකීමට නො වෙයි. අද ද ඇතැම් ජනමාධ්‍යවේදීන්ට ලංකා රාජ්‍යයේ ආරක්ෂාව ගැන වගවිභාගයක් නැත. ඇතැම් ඉරිදා පුවත්පත්වල රාජ්‍ය රහස් ආරක්ෂාවන්නේ ගණිකාවකගේ පතිවත මෙනි. රාජ්‍යයට ද තම රහස් ආරක්ෂාකිරීමට වැඩ පිළිවෙළක් නැත. එසේ වූ පමණින් වගකිවයුතු පුවත්පත් ඒ රහස් පළකළ යුතු නො වේ. එහෙත් මෙරට ජාතියට වගකියන පුවත්පත් කතුවරුන් ඇත්තේ අතේ ඇඟිලිවලට ද අඩු සංඛ්‍යාවකි. සෙස්සන් වගකියන්නේ බටහිරට ය. ඔවුන්ට බටහිර රටවල තානාපති සරණ ලැබෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva